රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 09/96

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

1996.03.20 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත්
සභාවල ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

<u>රජයේ සේවකයන් සඳහා අතුරු දීමනාවක් ගෙවීම.</u>

1994.07.01 දිනට පසුව කවර හෝ වැටුප් වැඩිවීමක් නොලද සියළුම රජයේ සේවකයන්ට 1996 ජනවාරි 01 සිට රු. 100/- ක මාසික අතුරු දීමනාවක් ගෙවිය යුතු අතර, 1996 ජුලි 01 දින සිට මෙම අතුරු දීමනාව රු. 250/- දක්වා විය යුතුය.

02. මෙම දීමනාව සියළුම අනියම් /ආදේශක සහ දවස් පඩි ලබන සේවකයන්ට ද ඔවුන් වැඩ කළ දින ගණන මත මසකට දින 21 ක අවමය පදනම් කරගෙන සමානුපාතිකව ගෙවිය යුතුය.

03. රජයේ සේවකයින්ට මෙම දීමනාව ගෙවන පදනම මතම පළාත් රාජ්‍ය සේවකයන්ටද මෙම දීමනාව ගෙවිය යුතුය.

04. මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන , වෙනත් දීමනා වැය සංකේතය යටතේ ලබාගත නොහැකි වූ විට, අනෙකුත් පුනරාවර්තන වැය සංකේතයන්ගේ ඉතිරිවීම් වලින් වීරමොන් ක්‍රියා පරිපාටිය අනුගමන කරමින් ලබා ගත යුතුය. මේ ආකාරයෙන් අරමුදල් ලබා ගත නොහැකි වූ විට පමණක්, අතිරේක මුදල් සැදී ඇති ආකාරය පෙන්නුම් කරමින්, අතිරේක අරමුදල් සඳහා ඉල්ලුම් පත්‍රයක් අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ හැකිය.

05. මෙම චක්‍රලේඛය නිකුත් කරනුයේ මහා භාණ්ඩාගාරයේ එකගත්වය ඇතිවය.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙණිය)
වැඩබලන ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය